# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1833/10 - 2013 ඔක්තෝබර් මස 23 වැනි බදාදා - 2013.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා විසින් කරන ලද පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර ටිකිරි බණ්ඩා කොබ්බෑකඩුව වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | |
|---|---|
| I. එම්. එස්. ප්‍රේමවංශ මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. 1 | මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත්පාලන හා පළාත් පරිපාලනය, මානවසම්පත්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ඉඩම්, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් බෙදාහැරීම් කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ, වෙනත් අමාත්‍යාංශයක් යටතට නොගැනෙන විෂයයන් සම්බන්ධ අමාත්‍යාංශයේ ලේකම්. |
| II. කේ. කැකුලන්දර මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. - විශේෂ ශ්‍රේණිය | මධ්‍යම පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන සහ පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම් |
| III. බී. එම්. නිමල් බාලසූරිය මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. - විශේෂ ශ්‍රේණිය | මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, ධීවර පරිසර කටයුතු, හින්දු සංස්කෘතික සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් |
| IV. පී. බී. විජයරත්න මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. - විශේෂ ශ්‍රේණිය | මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් |
| V. ඒ. එම්. යූ. ඩී. අලහකෝන් මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. 1 | මධ්‍යම පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු, වනිතා කටයුතු, ග්‍රාමීය සංවර්ධන සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් |

ටිකිරි බණ්ඩා කොබ්බෑකඩුව,
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

11-210


1A - PG 001803 — 165 (2013/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*